සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

14 S I

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය :.................................... ක්‍රිස්තියානි ධර්මය - I කාලය: පැය 01යි.

වැදගත් :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(1) ඉශ්‍රායෙල් හි අධිපතිත්වය දැරීමට පැමිණෙන තැනැන්වහන්සේගේ උපත හා පෙළපත පිළිබඳ අනාවැකි එල කළ දිවැසිවරයා වන්නේ,
1. මලාකි දිවැසිවරයා ය. 2. යෙසායා දිවැසිවරයා ය.
3. ආමොස් දිවැසිවරයා ය. 4. මීකා දිවැසිවරයා ය.

(2) ජේසුස් වහන්සේ තම ලොව පහළ වීමේ අරමුණු සඳහන් වන, යෙසායා දිවැසිවරයාගේ අනාවැකිය ප්‍රකාශයට පත් කරන ලද්දේ,
1. ජෙරුසලම් දේව මාළාගාවේදී ය. 2. නාසරෙත් ධර්ම ශාලාවේදී ය.
3. ගලීලයේ මුහුද අසලදී ය 4. ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරනයේදී ය.

(3) ගාබ්‍රියෙල් දේවදූතයා පැවසූ ශුභාරංචියට අනුමානයෙන් යුතුව ප්‍රතිචාර දැක්වූයේ,
1. මරියතුමී ය. 2. ජෝසෙප් ය. 3. සෙකරියස් ය. 4. එළිසබෙත් ය.

(4) පලස්තීනයේ විසූ ජුදෙව් ජනතාව රෝම අධිරාජ්‍යයට යටත් වීම නිසා,
1. දේශපාලනික වශයෙන් මහත් පීඩාවකට ලක්ව සිටියේ ය.
2. දේශපාලනික ලෙස නිදහස ලැබුවේ ය.
3. ආගමික වශයෙන් මහත් පීඩනයකට ලක්ව සිටියේ ය.
4. ආගමික වශයෙන් නිදහස ලැබුවේ ය.

(5) ජුදෙව් ජනතාව දෙවියන් වහන්සේට සන්තක වීම අර්ථ ගැන්වීම සඳහා ඉටු කරනු ලැබූ චාරිත්‍රය වන්නේ,
1. කැප කිරීමේ පිළිවෙතයි. 2. නම් තැබීමේ පිළිවෙතයි
3. චර්මඡේදන පිළිවෙතයි 4. බෞතීස්ම පිළිවෙතයි

(6) ''කමත හොඳ හැටි පිරිසිදු කරන පිණිසත් ධාන්‍ය පොළා සිය අටුවේ රැස් කරන පිණිසත් උන්වහන්සේගේ අතේ කුල්ල ඇත.'' මෙමගින් අර්ථ ගැන්වෙන්නේ,
1. මිනිස් ජීවිත ගැන අවසාන තීරණය ගන්නේ ජේසුස් වහන්සේ විසින් බව ය.
2. උන්වහන්සේ කුල්ලෙන් පොලා බොල් ඉවත් කරන බව ය.
3. ධාන්‍ය පිරිසිදු කිරීමට කුල්ල අවශ්‍ය බව ය.
4. මිනිස් ජීවිතය තුළ ඇති අපිරිසිදු දේ ඉවත් කරන බව ය.

(7) භක්තිමත් ජුදෙව් තරුණයෙකු සේ සිනගෝගයට නිතිපතා ගොස් නමස්කාරයේ හා ඉගැන්වීමේ යෙදුනේ,
1. ස්නාවක ජොහන්තුමා ය. 2. ජේසු තුමා ය.
3. පාවුල් තුමා ය. 4. පේදුරුතුමා ය.

(8) ''ස්වාමීනි මා වෙතින් ඉවත් වුව මැනව, මම පව්කාර මනුෂ්‍යයෙකි.'' පේදුරු මෙසේ ප්‍රකාශ කළේ,

1. මසුන් රාශියක් අල්ලාගත් නිසා ය.
2. තම දෙමාපියන් අතහැර යාමට අකමැති නිසා ය.
3. වගකීම් දැරීමට අකමැති වූ නිසා ය.
4. ජේසුස් වහන්සේගේ ශුද්ධවන්තකම හා දේවත්වයේ බලය අත්දුටු නිසා ය.

(9) ''වෛරයෙන් පිරුණු තැනට ප්‍රේමයද අසමගිය ඇති තැනට ශාන්තිය ද අවිශ්වාසයෙන් යුත් තැනට විශ්වාසය ද...'' මෙසේ යාච්ඤා කළේ,

1. ජේසුස් වහන්සේ ය.
2. ශ්‍රාවකයන් ය.
3. අසීසියේ ෆ්‍රැන්සිස්තුමා ය.
4. දිවැසිවර සිමියොන් ය

(10) ජුදෙව්වන් අතරින් තම සහෝදර ජනතාව කෙරෙහි අනුකම්පා විරහිතව කටුයතු කළ දේශද්‍රෝහීන් ලෙස නම් කළ ජන කණ්ඩායමක් වන්නේ,

1. සමාරිතයන් ය.
2. අයකැමියන් ය
3. පරිසිවරුන් ය.
4. සද්දුසිවරුන් ය.

(11) දේව පවුලේ දූ පුතුන් වීමේ භාග්‍යය යන ආශිර්වාදය නිතැතින්ම හිමි කර ගන්නේ,

1. දේව කැමැත්ත තේරුම්ගෙන එය ඉටු කරන අයයි.
2. පාරම්පරික කිතුණුවන්ව සිටින අයයි.
3. දේවස්ථානයේ වැඩ කටුයතුවල නිරතුරු සම්බන්ධ වන අයයි.
4. අපේ ජීවිතවල දේව කැමැත්ත කුමක්දැයි නිතර සොයා බලන අයයි.

(12) A - හෝරාවේ අභ්‍යන්තර හරය ගැඹුරින් හැදෑරීම වෙනුවට එම නීති රීතිවල බාහිර ස්වරූපය ඉස්මතු කිරීම
B - තමන්ගේ ධාර්මික බව ගැන අතිශයින් උඩඟුවීම
C - අන්‍ය ජාතීන්ගේ සිරිත් විරිත් සුපිරිසිදු යැයි පවසමින් ඔවුන් වෙතින් වෙන්වීම
D - තම අන්තවාදී ආගමික හා දේශපාලනික අදහස් ජනතාවට පිළිගැන්වීම.
ඉහත ලක්ෂණ චරිතායනය කළ ජුදෙව් ජන කණ්ඩායම වන්නේ,

1. සද්දුසිවරු
2. විනයධරයන්
3. සෙලම්වරු
4. පරිසිවරු

(13) ජීවිතයේ පැමිණෙන සෑම දුක් පීඩාවකට ම ධෛර්ය ශක්තිය ලබා ගැනීමට හැකිවන්නේ යාච්ඤාව තුළින් ය. ඒ බව ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් පිළිඹිබු වූ අවස්ථාව වන්නේ,

1. කුරුස ගහේ යාච්ඤාවෙන් ය.
2. ගෙත්සෙමනේ යාච්ඤාවෙන් ය.
3. උත්තම පූජක යැදුමෙන් ය.
4. ගෝලයින් තේරීමට පෙර කළ යැදුමෙන් ය.

(14) A - දේවදූතයන් හා පුනර්ජීවනය පිළිබඳ විශ්වාස කිරිම
B - ලිඛිත ව්‍යවස්ථාව පමණක් භාවිත කිරීම
C - ජෙරුසලම් දේව මාළිගාව තම බල කේන්ද්‍රස්ථානය කර ගැනීම
D - ආගමික නීති රීති ඉතා පරෙස්සමින් ආරක්ෂා කිරීම
ඉහත ලක්ෂණවලින් සද්දුසිවරුන්ට පමණක් ආවේණික ලක්ෂණ ඇතුළත් වරණය වන්නේ,

1. A හා D
2. B හා C
3. B හා D
4. C හා D

(15) ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වය දැරුවේ,

1. උත්තම පූජකයා ය.
2. පරිසිවරු ය.
3. සද්දුසිවරුන් ය.
4. පිලාත් ආණ්ඩුකාරයා ය.

(16) මිනිස් වර්ගයාට සදාකාල ජීවනයට දොරටු විවර කරන නව බලාපොරොත්තුවේ ශුභාරංචිය වූයේ

1. ජේසුස් වහන්සේගේ උපතයි.
2. ජේසුස් වහන්සේගේ මරණයයි
3. ජේසුස් වහන්සේගේ උත්ථානයයි
4. ජේසුස් වහන්සේගේ බෞතීස්මයයි

(17) ජේසුස් වහන්සේගේ ජීවමාන බව ප්‍රථමයෙන් අත්දුටුවේ

1. ජෙරුසලමේ එක්ව කතා කරමින් සිටි ශ්‍රාවකයන්ට ය.
2. එම්මාවුන් බලාගිය ගෝලයින් දෙදෙනාට ය.
3. සොහොන වෙත ගිය කාන්තාවන්යට ය.
4. උඩුමහලේ සිටි ශ්‍රාවකයන්ට ය.

(18) ක්‍රිස්තුස් වහන්සේගේ බෞතීස්මය ගැන නිදහස් සුභාරංචිය වනුයේ,

1. මතෙව්, ලූක්, ජොහන් ය. 2. මතෙව්, මාක්, ලූක් ය.
3. ජොහන්, මතෙව්, මාක් ය. 4. ලූක්, ජොහාන්, මතෙව් ය.

(19) ජේසුස් වහන්සේගේ පරීක්ෂා හා සටන් කිරීමෙන් අපිට උගන්වන්නේ,

1. දේව කැමැත්තට අනුකූලව සුමග සෙවීමට ය.
2. උපවාසයේ සිට යාච්ඤා කිරීමට ය.
3. යහපත් ලෙස පෙනෙන දෙයින් සෑහීමට පත් වීමය.
4. වඩා පහසු මග ඔස්සේ ගමන් කිරීමට ය.

(20) ජේසුස් වහන්සේගේ ජීවිතයේ සත්‍යතාවේ ආලෝකයෙන් අනාවරණය වූ අවස්ථාවක් වන්නේ,

1. බෞතීස්ම ස්නාපනයේදී 2. ජෙරුසලම් දෙව් මැදුරේදී
3. ගලීල මුහුද අසලදී 4. අන්වෙසක් වීමේදී

(21) දේව රාජ්‍යයේ වර්ධනය අභිරහස්‍යාත්මකව සිදුවන බව පෙන්වීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ උපමාවක් වන්නේ,

1. මුහුණ් පිළිබඳ උපමාව ය. 2. අබ ඇටයේ උපමාව ය.
3. වපුරන්නාගේ උපමාව ය. 4. නිධානය ගැන උපමාව ය.

(22) ''බිය නොවන්න, ඇදහිල්ලෙන්ම සිටින්න. ඈ සුව වනු ඇත.''මේ හා සම්බන්ධ අවස්ථාව වන්නේ,

1. කායින් නුවර වැන්දඹුවගේ පුතා මරණින් උත්ථාන කිරීම ය.
2. කුදු ස්ත්‍රිය සුව කිරීම ය.
3. ජායිරස්ගේ දියණිය මරණින් උත්ථාන කිරීම ය.
4. මහලේ රෝගී ස්ත්‍රිය සුව කිරීම ය.

(23) ජේසුස් වහන්සේ මහා මංගල භෝජනය පිළිබඳ උපමාව පවසන ලද්දේ,

1. අයකැමියකුගේ නිවසේදී ය. 2. ලෙවියෙකුගේ නිවසේදී ය.
3. ලියන්නකුගේ නිවසේදී ය. 4. පරිසිවරයෙකුගේ නිවසේදී ය.

(24) සුවය ලබා ජේසුස් වහන්සේට ස්තුති කිරීමට නැවත පැමිණි ජුදෙව් නොවන රෝගියා වන්නේ,

1. අංශභාග රෝගියා ය. 2. ලාදුරු රෝගියා ය.
3. දිය උදර රෝගියා ය. 4. උණ රෝගියා ය.

(25) ''ඔබේ ඉඟපටි බැඳ ගන්න. පහන්ද දල්වා තබා ගන්න'' මෙයින් අදහස් කරනුයේ,

1. තීරණාත්මක මොහොතකට නිසි පරිදි සූදානම් විය යුතු බව ය.
2. දේව රාජ්‍යයය උදෙසා සේවය කළ යුතු බව ය.
3. සොරුන්ට පහර දීමට සූදානම් විය යුතු බව ය.
4. අන්‍යන්ගෙන් වරප්‍රසාද ලබා ගැනීම සඳහා සූදානම් විය යුතු බව ය.

(26) ආබ්‍රහම්ගේ ජීවිත ආදර්ශය අනුව දෙවිඳුන්ට කීකරු වීමේ දී,

1. අපේ කැමැත්තට මුල් තැන දිය යුතු ය.
2. අපට හුරු පුරුදු දේ පරිත්‍යාග කළ යුතු ය.
3. අපේ නෑදෑයින්ගෙන් වෙන්ව යා යුතු ය.
4. අප නොදන්නා දුර ප්‍රදේශයකට යා යුතු ය.

(27) දේව කැඳවීමට ආබ්‍රහම් දක්වූ ප්‍රතිචාරයෙන් තහවුරු වන්නේ,

1. ඔහු තුළ දෙවිඳුන් කෙරෙහි ඇති ඇදහිල්ලයි.
2. ඔහුගේ බලාපොරොත්තු ඉටු කර ගැනීමේ අපේක්ෂාවයි.
3. ඔහුට සැපවත් ජීවිතයක් ගත කිරීමේ බලාපොරොත්තුවයි.
4. දේව පොරොන්දු ඉටු කර ගැනීමේ අභිලාෂයයි.

(28) දස පනතේ පනත් අතරින් පවුලක පැවතිය යුතු දෙමව්පිය දූ දරු සබඳතාවල අර්ථවත් බව හා වටිනාකම් පිළිබිඹු වන පනත වන්නේ,

1. පළමු පණත ය. 2. තුන්වන පණත ය. 3. පස්වන පණත ය. 4. හත්වන පණත ය.

(29) ඊශ්‍රායෙල් ඉතිහාසයේ ආලේපනය ලැබූ ජන කණ්ඩායමට අයත් වරණය වන්නේ,
1. පූජකවරු, සද්දුසිවරු, පරිසිවරු ය.
2. පූජකවරු, දිවැසිවරු, රජවරුන් ය.
3. සද්දුසිවරු, දිවැසිවරු, රජවරු ය.
4. පරිසිවරු, රජවරු, දිවැසිවරු ය.

(30) යෙසායා දිවැසිවරයාට අනුව මෙසියස් වහන්සේගේ පැමිණීම සිදුවන්නේ,
1. සාවුල් රජ පරපුරෙනි.
2. පාරාවෝ රජ පරපුරෙනි
3. සායිරස් රජ පරපුරෙනි.
4. දාවිත් රජ පරපුරෙනි.

(31) ඊශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේ තම එඬේරාණන් ලෙස සැලකූ බව අර්ථවත් ලෙස ඉදිරිපත් කරන්නේ,
1. ගීතාවලිය ග්‍රන්ථයයි.
2. නික්මයාම ග්‍රන්ථයයි.
3. උත්පත්ති ග්‍රන්ථයයි.
4. යෙසායා ග්‍රන්ථයයි.

(32) තමන් සතු සියළු දේ නැති වුණත් දෙවිඳුන් කෙරෙහි දෘඩ විශ්වාසයෙන් සිටි තැන්ත්තෝ වන්නේ,
1. මෝසෙස් ය.
2. යෙසායා ය.
3. ජෝබ් ය.
4. සලමොන් ය.

(33) ජුදා සෙනඟ බැබිලෝනියාවට ගෙන යන බවට අනාවැකි පැවසූ දිවැසිවරයා වන්නේ,
1. යෙසායා දිවැසිවරයා ය.
2. මීකා දිවැසිවරයා ය.
3. මලාකි දිවැසිවරයා ය.
4. ජෙරමියා දිවැසිවරයා ය.

(34) යෙසායා දිවැසිවරයාගේ කාලයේ දී ජුදෙව් ජනතාව බලා සිටියේ,
1. බැබිලෝනියේ විප්‍රවාසයට යන තුරු ය.
2. මෙසියස් වහන්සේ පැමිණෙන තුරු ය.
3. රජ කෙනෙකු පත්වන තුරු ය.
4. පාලනය වෙනස් වන තුරු ය.

(35) යෙසායා දිවැසිවරයාට අනුව දුක් විඳින ............................ තුළ දක්නට නොලැබෙන ලක්ෂණයක් වන්නේ,
1. දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය ලබා සිටියි.
2. සැර පරුෂ ගති ලක්ෂණ වෙනුවට මෘදුලීලාවෙන් සැරසී සිටියි.
3. පීඩාවට ලක් වූවන් තවත් පීඩාවට ලක් කරති.
4. කලකිරීමට පත් නොවී යුක්ති සහගත ලෙස ක්‍රියා කරයි.

(36) ජුදෙව් ජනතාව මෙසියස් හෙවත් ආලේප ලත් තැනැත්තා තුළින් බලාපොරොත්තු වූ භූමිකාවක් වූයේ,
1. ආගමික හා දේශපාලන භූමිකාවන් ය.
2. රාජකීය හා දේශපාලන භූමිකාවන් ය.
3. ආගමික හා රාජකීය භූමිකාවන් ය.
4. සංස්කෘති හා රාජකීය භූමිකාවන් ය.

(37) ප්‍රේමය තුළ දෙවියන් වහන්සේගේ පරිපූර්ණත්වයෙන් පූර්ණ වන පිණිස යාච්ඤා කරන්න යැයි පාවුල් තුමා පැවසුවේ,
1. එපීස වැසියන්ට ය.
2. කොරෙන්ති වැසියන්ට ය.
3. පිලිප්පි වැසියන්ට ය.
4. ජුදා වැසියන්ට ය.

(38) ප්‍රේමය නොමැති තැනැත්තා සමාන කරන්නේ,
1. වගකීම් ඉටු නොකරන්නෙකුට ය.
2. හිස් තැනැත්තෙකුට ය.
3. ආත්මාර්තකාමී තැනැත්තෙකුට ය.
4. හනික කිපෙන අයෙකුට ය.

(39) අසීමිතව කමාවීමේ වැදගත්කම ජේසුස් වහන්සේ පැහැදිලි කළේ,
1. ජොහාන්ට ය.
2. පේදුරුට ය.
3. ජුදස්ට ය.
4. පාවුල්ට ය.

(40) ''ඔබ කළ වරදට මම කමාව දෙමි'' පවසමින් සමාව දානය කළේ,
1. අලි අග්ගාර විසින් ය.
2. ගරු ජෙරාඩ් ද සිල්වා දේවගැතිතුමා ය.
3. ජේසුස් වහන්සේ විසින් ය.
4. දෙවන ජුවාම් පාවුලු පාප් වහන්සේ ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

14 S II

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
# First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය :....................................... ක්‍රිස්තියානි ධර්මය - II කාලයඃ පැය 02යි.

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

✳ පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

(1) (i) කිතු උපත පිළිබඳ දිව්‍යස් වැකි පැවසූ දිවැසිවරුන් දෙදෙනෙකු නම් කරන්න.

(ii) ''මක්නිසා ද දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැත'' මෙසේ ප්‍රකාශ කළේ කවුද? කාටද?

(iii) යේසුස් වහන්සේ ඔලීව කන්දේ යාඥා කරන විට එතුමාගේ හිතේ බලවත් ශෝකයක් තිබුණු බව පෙන්නුම් කළ ආකාර 2 ක් ලියන්න.

(iv) යේසුස් වහන්සේ කුරුසිපත් කළ අවස්ථාවේ දේවමාළිගාවේ තිරය දෙකඩ වීම තුළින් ගම්‍ය වන්නේ කුමක් ද?

(v) යේසුස් වහන්සේගේ ජීවමාන වැඩ විසීම පිළිබඳ සාක්ෂිය සකල ලෝකවාසීන් වෙත ගෙන යාමට මූලික වූ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න.

(vi) එහි නායකත්වය දැරුයේ කවුද?

(vii) දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග කළ ගිවිසුමේදී දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දු 2 ක් ලියන්න.

(viii) ''සම්පූර්ණ සාමය'' යන අර්ථය ඇති හෙබ්‍රෙව් හා ග්‍රීක වචන ලියා දක්වන්න.

(ix) ජෙරමියා දෙවියන් වහන්සේගේ වචනය ප්‍රකාශ කළේ, කුමන ජන කොටසකට ද එකළ ඔවුන්ට තර්ජන පැමිණියේ කුමන අධිරාජ්‍යයෙන් ද?

(x) මිනිසා දේව ප්‍රේමයෙන් ඈත්වීමට මුල් වූ හේතු 2ක් ලියන්න.

(ලකුණු $2 \times 10 = 20$)

(2) (i) ස්නාවක ජොහාන් විසින් යේසුස් වහන්සේ තම අනුගාමිකයන්ට හඳුන්වා දුන්නේ කෙසේ ද? (ල. 02)

(ii) ජොහාන්තුමා තම දේශනා ඉදිරිපත් කළ ජන කොටස් 3 ක් නම් කර ඔවුන්ට දුන් උපදෙස් ලියා දක්වන්න (ල. 03)

(iii) කිතුණු ඔබ ජොහාන්තුමාගේ ඉගැන්වීම් වත්මන් සමාජය තුළ ක්‍රියාවට නංවන ආකාරය කරුණු 5ක් යටතේ කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(3) (i) මළවුන්ගෙන් උත්ථාන වූ යේසුස් වහන්සේ ගෝලයන් 2 කුට මුන ගැසුනේ කුමන ප්‍රදේශයේ සිට කුමන ප්‍රදේශයට යන අතර තුරදී ද? (ල. 02)

(ii) යේසුස් වහන්සේ ජීවමාන බව අත්දැකීමට අපට ඇති බාධක 3 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

(iii) ක්‍රිස්තුස් වහන්සේ ජීවමාන බව අත්දුටු පුද්ගලයන් හා ඊට අදාළ අවස්ථා 3 පිළිබඳ විස්තර කරන්න.

(ල. 05)

(4) (i) එසකියෙල් දිවැසිවරයා සඳහන් කරන එඬේර භූමිකාවේ ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 02)

(ii) යේසුස් වහන්සේගේ ජීවිතයෙන් එම ලක්ෂණ විදහා දැක්වූ අවස්ථා 3 ක් ලියන්න. (ල. 03)

(iii) කිතුණු දරුවෙකු වන ඔබ යහපත් එඬේරකු ලෙස පාසල / සමාජය තුළ ක්‍රියා කරන ආකාරය කරුණු 6 කින් විස්තර කරන්න. (ල. 05)

(5) (i) ජුදා ජනතාව වෙත අනාවැකි ඉදිරිපත් කළ ජෙරමියාට මුහුණ දීමට සිදු වූ අභියෝග 2 ක් ලියන්න.(ල. 02)

(ii) ජෙරමියාගේ කතාව තුළින් අපට ඉගෙන ගත හැකි වැදගත් සත්‍යතා 03 ක් ලියන්න. (ල. 03)

(iii) දුක් විඳින සේවකත්වයේ ආදර්ශය ලබමින් එම සේවකත්වයේ භූමිකාව ජීවමාන කරවීමට අප කෙසේ ක්‍රියා කළ යුතු දැයි කරුණු 5 කින් විස්තර කරන්න. (ල. 05)

(6) (i) යේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව ''අසල්වැසියා'' යනු කවුද? (ල. 02)

(ii) (ශු. මාර්ක් 12 :29 - 33)'' නුඹේ මුළු හෘදයෙන් ද..... යන බයිබල් පාඨයෙන් දෙවියන් වහන්සේට ප්‍රේම කළ යුතු ආකාරය ජෙරමියා පෙන්වා දෙයි. ඉහත බයිබල් පාඨයේ සඳහන් පරිදි දෙවියන් වහන්සේට ප්‍රේම කළ යුතු අනෙක් අංශ 3 ලියා දක්වන්න. (ල. 03)

(iii) යේසුස් වහන්සේ ලොවට දායාද කළේ පරිත්‍යාග වූ ප්‍රේමය ය. යේසුස් වහන්සේගේ ජීවිතයේ ප්‍රේමය දැක්වූ ප්‍රධාන අවස්ථා 03 පිළිබඳ උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ල. 05)

(7) පහත සඳහන් මාතෘකා අතරින් 02 ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) සාමය ඇතිකරන්නෝ භාග්‍යවන්තයෝ ය.

(ii) කමාව අත්දැකීමේ උතුම්කම

(iii) සභා ඒකත්වය

(iv) දස පණත තුළින් ජීවිතයට ආලෝකයක්

(ල. 5 + 5 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

14 | S | I II

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 11 - 2020

## ක්‍රිස්තියානි ධර්මය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 4 | 11 | 1 | 21 | 1 | 31 | 1 |
| 2 | 2 | 12 | 4 | 22 | 3 | 32 | 3 |
| 3 | 3 | 13 | 2 | 23 | 4 | 33 | 4 |
| 4 | 1 | 14 | 2 | 24 | 2 | 34 | 2 |
| 5 | 3 | 15 | 1 | 25 | 1 | 35 | 3 |
| 6 | 1 | 16 | 3 | 26 | 2 | 36 | 2 |
| 7 | 2 | 17 | 3 | 27 | 1 | 37 | 1 |
| 8 | 4 | 18 | 2 | 28 | 3 | 38 | 2 |
| 9 | 3 | 19 | 1 | 29 | 2 | 39 | 2 |
| 10 | 2 | 20 | 4 | 30 | 4 | 40 | 4 |

### II පත්‍රය

(1) (i) මීකා , යෙසායා

(ii) ගාබ්‍රියෙල් දේවදූතයා විසින් මරියතුමියට

(iii) * පීඩාව පහ කරන ලෙස යාච්ඤා කිරීම

* උන්වහන්සේගේ දහඩිය බිඳු ලේ බිඳු මෙන් බිමට පතිත වීම.

(iv) දෙවි සමිඳුන් වෙතට ළඟාවීමට තිබූ බාධකය ජේසුස් වහන්සේගේ කුරුසි පූජාව තුළින් ඉවත් වූ බව.

(v) පාවුල් හා ජේදුරු

(vi) සැන්හෙඩ්‍රින් සභාව / උත්තම පූජකයා

(vii) විශාල ජාතියක් හා දේශයක් ලබාදෙන බව.

(viii) (හෙබ්‍රෙව්) - (ශාලෝම්) ග්‍රීක - අයිරේනියා

(ix) ජුදා ජනයාට, බැබිලෝනියෙන්

(x) අකීකරුකම හා තෘෂ්ණාව (ල. 2 x 10 = 20)

(2) (i) මෙන්න ලෝකයේ පව් දුරු කරන දෙවියන්ගේ බැටළු පෝතකයාණෝ (ල. 02)

(ii) පොදු ජනතාව - අඳනා දෙකක් ඇති අය නැති අයට දෙත්වා

රාජ්‍ය සේවයේ - නියමිත පමණට වැඩියෙන් අයබදු අය නොකරන්න.

අරක්ෂක අංශ - කිසිවෙකුගෙන් බලහත්කාරකමින් කිසිවක් පැහැර නොගන්න. (ල. 03)

(iii) ලියා ඇති පිළිතුරට අනුව එක් කරුණකට ලකුණු 1 බැගින් ලබාදෙන්න. (ල. 05)

(3) (i) ජෙරුසලමේ සිට එම්මාවුස් බලා (ල. 02)

(ii) අවිශ්වාසය / සැකය හා වියවුල / සාක්ෂි දැරීමට මැලිවීම පිළිබඳ කෙටි විස්තර සපයා තිබිය යුතු ය.(ල. 03)

(iii) සොහොන වෙත ගිය - ස්ත්‍රීන්

මුහුද මත ඇවිදින්න - ජේදුරු

ගෝලයන් එකලොස්දෙනාට - දර්ශනයට (ල. 05)

(4) (i) බැටළුවන් සුනිල් තණ බිමක සතප්වා ඔවුන් හොඳ තෘණවලින් පෝෂණය කරන්නාහ. (ල. 02)

(ii) මග පෙන්වීම - මම නැති වූ බැටළුවා සොයන්නෙමි. මුලාව ගිය බැටළුවා ආපසු ගෙනෙන්නෙමි.

ආරක්ෂාව - මරණය වැනි රුදුරු නිම්නය මැදින් ගියත්....

හඳුනා ගැනීම - බැටළුවෝ ද එඬේරාගේ හඬ අඳුනති. (ල. 03)

(iii) සිසුවා ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු දෙන්න. (ල. 05)

(5) (i) * මඩ පිරුණු වලක සිටීමට සිදුවීම

* ආහාර නොලබා සිටීමට සිදුවීම (ල. 02)

(ii) * අප දෙවිඳුන්ගේ කැමැත්ත ඉටු කළ යුතු බව

* දේව කැමැත්තට විවෘතවන විට දරාගත නොහැකි දුක් කරදරවලට මුහුණදීමට සිදුවනවිට

* අපි දෙවිඳුන් කෙරේ ඇදහිලෙන් ජීවත් විය යුතු ය.

* ඇදහිල්ලෙන් හා ස්ථිරව ජීවත්වන විට දෙවියන් වහන්සේ අප අත් නොහරින බව. (ල. 03)

(iii) * දුක් විඳීමේ සිට මරණය දක්වා වූ ක්‍රියාතුළින් සේවකත්‍වයට කැපවීමේ ආදර්ශය දුන් ක්‍රිස්තුස් වහන්සේ මෙන්

* දුක් විඳීමේ සැබෑ තත්වයට මුහුදණ දීම හා එය විඳ දරු ගැනීම.

* මමත්වය නසා දමා පරාර්ථකාමී සේවකත්වයට ඇතුළ් වීම.

* කුරුසි මාර්ගය අනුගමනය කිරීම (අපහාස විඳීම) ප්‍රතික්ශේපවීම. කසපහර විඳීම, වේදනා විඳීම, වැයවීම, කැපවීම)

* ධෛර්යය හා ඇදහිල්ල

* පූජාවීමේ සේවය (ල. 05)

(6) (i) ඕනෑම අවස්ථාවක තමා අවට සිටින අවශ්‍යතාවයෙන් පෙලෙන ඕනෑම කෙනෙකු ය. (ල. 02)

(ii) නුඹේ මුළු ආත්මයෙන්ද?

නුඹේ මුළු බුද්ධියෙන්ද?

නුඹේ මුළු වීර්යයයෙන්ද? (ල. 03)

(iii) සේවය - නුඹට මෙන් නුඹේ අසල් වැසියාට ප්‍රේමකරන්න

දුක්විඳීම - මුළු ලෝකයා වෙනුවෙන්ම

මරණය - පරිත්‍යාගී ජීවිතය තුළින් (ල. 05)

(7) කෙටි සටහන්

(i) සාමය - කන්ද උඩ දේශනාව පිළිබඳව (6 පාඩම - 19, 20 පිටු)

(ii) කමාව අත්දකීමේ උතුම්කම - (7 පාඩම - 24, 25 පිටු)

(iii) සභා ඒකකත්වය - (8 පාඩම 29 පිටුව 11 ශ්‍රේණිය)

(iv) දස පනත තුළින් ජීවිතයට ආලෝකයක් - කළ යුතු හා නොකල යුතු පනත් පිළිබඳ (11 ශ්‍රේණිය 213 පිටු)

ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න. (ල. 5 + 5 = 10)